// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2325/22 - 2023 මාර්තු මස 28 වැනි සඳුදා - 2023.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා.ලේ.අංකය:* BD/BW/LND/6/ACUIS/39
*මගේ අංකය:* 4-3/9/2017/WS/110.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බඹරගම ගමේ පිහිටි බදුල්ල මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කර ඇති අ.ග.පි. 247 අතිරේක අංකය 40, පත්‍ර අංකය 40 හි හෙක්ටයාර් 0.0253 ක් විශාල වූ බිම් කැබැල්ල.

මායිම්,
*උතුරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බඹරගම අම්පිටිගොඩවත්ත; *නැගෙනහිරට*: මාර්ගය (පළාත් මා.සං.අධි) *දකුණට* : මාර්ගය (පළාත් මා.සං.අධි) සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව: හිමිකම් කියන බඹරගම අම්පිටිගොඩවත්ත: *බටහිර*: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බඹරගම අම්පිටිගොඩවත්ත.

හිමිකම් කියන අය : සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ග්‍රෙගරි මාවත, කොළඹ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 මැයි මස 05 වැනි දින පෙ.ව.9.00 ට බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2023 මාර්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

අයි.ජී.අයි.ටී.රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
බණ්ඩාරවෙල.

2023 පෙබරවාරි මස 27 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 03-0359

ශුද්ධි පත්‍රයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : 5/3/5/968-7.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය : 03/ජේ/81/LG/279.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 716/12 හා 1992.02.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මාගේ දැන්වීමේ සඳහන්, මා 968 මූලික පිඹුරෙහි කැබලි අංක 7 කොටසට අදාළ වන්දි පරීක්ෂණ දිනය 1992.08.06 යන්න 2023.05.10 ලෙසත්, හිමිකම් ඉදිරිපත් කිරීමට ලබා දී ඇති දිනය 1992.07.31 යන්න 2023.05.31 යන්න ලෙසත්, සංශෝධනය කරන බව මෙයින් දන්වා සිටිමි.

පියල් ජයසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
දඹුල්ල.

2023 මාර්තු මස 23 වැනි දින,
දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 03-0360

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.